# විමලුයි මායි දෙන්නම මහින්දගේ ප්‍රෝඩාවට විරුද්ධයි.

කොටි සංවිධානය පරාජය කිරීම යන ඉලක්කය උඩ මහින්ද රාජපක්ෂ ජනතාව දිනාගැනීමට වැඩ කරගෙන ගිය බව දන් කවුරුත් දන්නව. ජනතා විමුක්ති පෙරමුණ ඔහුව කර තියාගෙන ගියෙත් මේ මූලික අදහස උඩමයි.

ඒත් සටන ගෙනියන්න ලෝක බලවතුන්ගේ ආධාර උපකාර ඕන වුණා. ඒ උඩ මහින්ද මුළුමණින්ම ගෝලීය බලවතුන්ගේ හෙංචයියෙක් බවට පත් වුණා.

උතුරු නැගෙනහිර අල්ලා ගැනීම යනුවෙන් මේ බලවතුන් කල්පනා කරන්නේ ඔවුන්ගේ ආර්ථික සැලසුම් ඒ පළාත්වල දියත් කර ගැනීමයි. එහෙම නැතිව සිංහල හමුදා යටතට ඒ පෙදෙස් පත්කර ගැනීමම නෙවෙයි. ඒක වුණත් එකයි, නැතත් එකයි. ඔවුන්ට උවමනා වෙලා තියෙන්නෙ තමන්ගේ ආයෝජන සැලසුම්වලට ඒ පළාත් අල්ලා ගැනීමයි.

බහුජාතික සමාගම් තන්ත්‍රය, ඉංදීය කොම්පැණි ඇතුළුව දන් මේ "අල්ලා ගන්නා පෙදෙස්"වල වැඩ පටන් අරන්. ඉංදියාව ගල් අඟුරු බලාගාරය ඉදි කිරීම පමණක් නෙවෙයි, වෙනත් ආයෝජන ගැනත් බලාපොරොත්තු ඇති කරන් ඉන්නේ. විශාල බිම් පෙදෙස්වල අළුත් වගාවන් ඇති කිරීම එක පැත්තක්.

මේ වෙනුවෙන් මේ පළාත්වල දෙමළ ජනතාවම සරණාගතයන් වීම ඔවුන්ට ගජ වාසියක්. මේ සරණාගතයන් තෝරා ගත් තැන්වල තට්ටු ගෙවල් හෝ නිවාස සංකීර්ණ හෝ තුළට දක්කා ගැනීම එක් පියවරක්. ඒ වගේම ධීවරයන් යම් යම් වරායවල් කීපයකට සීමා කරල වෙරළ තමන් වෙනුවෙන් මහාපරිමාණව පවරා ගැනීම තව පියවරක්. ඒ ධීවර කර්මාන්තයට පමණක් නෙවෙයි, මහා පරිමාණ සංචාරක නිකේතන සඳහාත් වෙන් කර ගැනීමට අවශ්‍ය නිසා.

මේ වැඩ පිළිවෙල ගෙන යාමට කොටි සංවිධානය එකඟ කර ගැනීමට පුළුවන් නම් ඔවුන් ඒ අයට වුණත් බලතල ලැබෙන සාමයකට එකඟයි. විශේෂයෙන් ග්‍රීන් කාර්ඩ් අරගත් කොටි සංවිධානයේ හිතවතුන් සමඟ ගෝලීය බලවතුන් එකඟතාවයක් ඇති කර ගැනීමට ඉඩ තියෙනව.

ඔවුන්ට ගැලපෙන සාමයක් සඳහා ඒ අනුව විසඳුම් පැටවීමට බලවතුන් උත්සාහ කරන බව දන් හොඳටම පැහැදිලියි. ඒ තුළින් ඔවුන් බලාපොරොත්තු වෙන්නේ දෙමළ ඊළමක් නම් නෙවෙයි. ඔවුන්ගේ ආර්ථික සැලසුම් උතුරු-නැගෙනහිරට ගෙන යාමයි ඒ අයගේ බලාපොරොත්තුව.

මහින්ද සමඟ ලෝක බලවතුන් එකඟ වෙන්නේ මෙවැනි පදනමක් උඩයි. මේ තත්වය දන් ජනතා විමුක්ති පෙරමුණට ලොකු ගැටළුවක් වෙලා. ඒත් ඒ අය මේ ගැන එළිපිට නොකියා තවමත් හඳන්නේ මහින්ද කොටි සංවිධානයට යට වෙලා බලය බෙදන තැනට පත් වුණ බව කියන්නටයි.

13 ව්‍යවස්ථා සංශෝධනය ඔවුන්ට අනුව ඉංදියාව විසින් පටවන ලද කොටි උගුලක්. මං මීට ඉස්සෙල්ලත් පෙන්වල දුන්න මේ මහින්දගේ 13 ව්‍යවස්ථා සංශෝධනය කොටි උගුලක් නෙවෙයි, කොටින්ව මෙන්ම දෙමළ ජනතාව මර උගුලකට ගෙනියන බව.

දන් බැලුවහම මායි, විමලුයි දෙන්නම මහින්දගේ ප්‍රෝඩාවට විරුද්ධයි. හැබැයි ප්‍රතිවිරුද්ධ හේතු උඩ. මං කියන්නේ ඉංදියාව ඇතුළු ගෝලීය බලවතුන්ගේ බලපෑම උඩ මහින්ද 13 ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරන්නේ දෙමළ ජනතාව හිර කරන්නට කියලයි. ඒත් විමල්ලා කියන්නේ ඉංදියාවේ කුමන්ත්‍රණයක් උඩ කොටින්ට සහන දීමට මේ වැඩේ කරනව කියලයි.

කොහොම උනත් ආණ්ඩුවේ විමුක්ති යුද්ධය දැන් රට බලවතුන්ට පවරා දීමේ ජාවාරමක් වෙලා බව නම් කාටත් පැහැදිලි විය යුතුයි. ලස්සන වැඩේ එය දැන් කියන්නේ අපි නෙවෙයි, ජනතා විමුක්ති පෙරමුණ.

මහින්ද දැන් තමන් යන ගමනට එකතු කරන්නට කැස කවන්නේ වෙන කවුරුවත් නෙවෙයි රනිල් වික්‍රමසිංහ. මුළු ජනාධිපතිවරණය තුළම මහින්දත් ජනතා විමුක්ති පෙරමුණත් තරහයට කථා කළේ රනිල් රට පාවා දෙන කොටින්ට හිතවත් දේශද්‍රෝහියෙක් හැටියටයි.

දැන් ජනතා විමුක්ති පෙරමුණ පල්ලම් බහිද්දි ඒ හිස් තැනට මහින්ද ගන්න යන්නේ රනිල් වික්‍රමසිංහයි. විමල්ලා දැන් ඔළුවේ අත් ගහගෙන කල්පනා කරන්නේ මොන දෙයියන්ට කියන්නද කියලයි.

මේ දෙබෑයින්ට විරුද්ධ අළුත් පෙරමුණක් ගොඩනගන බව කිව්වත් කවුරු හවුල් කරගෙනද මේ අළුතින් ගොඩනගන්නට යන්නේ කියලා කියන්නට විමල්ලට බැරිවෙලා තියෙනව.

ඇත්තටම මේ දෙන්නටම විරුද්ධව ලොකු බලවේගයක් හදන්න නම් රැඩිකල් දෙමළ මුස්ලිම් තරුණයන් එකතු කරගන්නට වෙනව. ඒත් ජනතා විමුක්ති පෙරමුණට අරහං වෙලා තියෙන්නේ මේ කොටස් එකතු කරගැනීමයි.

ජනතා විමුක්ති පෙරමුණට කමක් නෑ රට යැංකි, මංකි හමුදාවලට යට වුණත් දෙමළුන්ට ස්වපාලනයක් දෙන්නේ නැතිව. මේ ගොල්ලන්ගෙ මාක්ස්වාදී ජංගිය ගලවන් වැටිල ජාතිවාදී කළු ජංගි එළියට එන්නේ ඔය ප්‍රශ්නයේදී තමයි.

කොහොම වුණත් ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවට විරුද්ධව සටන් මහ ගැනීමත් සමඟ වැඩ කරන ජනතා අරගලයත් නව වේගයකින් ඉදිරියට එනව. ඒත් පංති අරගලය තුළ විමල්ලට බෑ ජාතිවාදය අවුස්සන්න.

ගුරු සටන තුළ එය ඔප්පු වුණා. ඒ සටන ඔය තරමින් හරි දියත් කරගත්තේ ජාතිවාදී සටන්පාඨ නැතිව සැබෑ වෘත්තීය අයිතිවාසිකම්ම මුල් කරගත් නිසයි. හැබැයි ආණ්ඩුව කිව්වේ මේක කොටින්ට උදව් වෙන ජාතිද්‍රෝහී සටනක් කියලයි.

එහෙම කියද්දිත් ඒ සටන ඔය පමණටම නැග්ග එක ලොකු දෙයක්. මේ වෙලාවේ ලංකා ගුරු සංමයට තිබුනේ සටන තුළ ඉඳන් විවේචනය කරන එකයි.